# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1795/39 - 2013 ජනවාරි මස 31 වැනි බ්‍රහස්පතින්දා - 2013.01.31

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## ශ්‍රී ලංකා මහ බැංකුවේ නිවේදන

### විනිමය පාලන පනත යටතේ දැන්වීම (ලංකා ව්‍යවස්ථාදායක ප්‍රඥප්ති සංග්‍රහයේ 423 වැනි අධිකාරය)

1. ***විනිමය පාලන පනතේ 7, 10, 11 සහ 15 වගන්ති ප්‍රකාර අවසරය.***

(අ) සංශෝධිත 1987 අංක 36 දරන ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභා පනත යටතේ නිකුත් කරන ලද බලපත්‍රයක් මත ක්‍රියාත්මක වන ඒකක භාරයක ඒකක පහත දැක්වෙන 2 ඡේදයේ දක්වා ඇති කොන්දේසිවලට යටත්ව විදේශීය ආයතනික ආයෝජකයන්ට, ශ්‍රී ලංකාවෙන් පිටත සංස්ථාපිත සමාගම්වලට සහ ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික පුද්ගලයන්ට (ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික ශ්‍රී ලාංකිකයන්ද ඇතුළත්ව) නිකුත් කිරීමට සහ පැවරීමට විනිමය පාලන පනතේ 10, 11 සහ 15 වගන්තිවල කාර්යයන් සඳහා මෙයින් අවසරය ප්‍රදානය කරනු ලැබේ.

(ආ) ඉහත (අ) උපඡේදය යටතේ අවසර දෙන ලද ගණුදෙනුවක් සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික පුද්ගලයෙකුට කරන ගෙවීමක් හෝ එකී පුද්ගලයාගේ ගිණුමකට සිදු කරනු ලබන බැර කිරීමක් සඳහා විනිමය පාලන පනතේ 7 වගන්තිය යටතේ මෙයින් අවසර ප්‍රදානය කරන අතර, එවැනි ගෙවීම් හෝ බැර කිරීම් 2(ඇ) ඡේදය ප්‍රකාර සිදු කළ යුතු ය.

2. ***කොන්දේසි :***

(අ) මේ යටතේ අවසර දෙනු ලැබූ ගණුදෙනුවක පාර්ශ්වකරුවකු වන්නා වූ ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික පුද්ගලයෙකු විසින් එම තැනැත්තා ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසිකයෙකු වන බවට ඒකක මිල දී ගැනීම සඳහා වන අයැදුම්පත්‍රයෙහි ප්‍රකාශයක් කළ යුතු ය.

(ආ) නිකුතුවක් හෝ පැවරීමක් යටතේ ඒකක මිලදී ගැනීම සඳහා කරනු ලබන ගෙවීම පහත සඳහන් ආකාරවලින් පමණක් කරනු ලැබිය යුතු ය.

(i) ඉහත 1(අ) ඡේදයේ සඳහන් පරිදි අයෝජනය කරනු ලබන පුද්ගලයාගේ නමින් ශ්‍රී ලංකාවේ බලපත්‍රලාභී වාණිජ බැංකුවක විවෘත කරන ලද සුරැකුම්පත් ආයෝජන ගිණුමකින් (SIA) හෝ ඕනෑම විදේශ මුදල් ඒකකයකින් පවත්වාගෙන යන ගිණුමකින් ; හෝ

(ii) ඉහත 1(අ) ඡේදයේ සඳහන් පරිදි ආයෝජනය කරනු ලබන පුද්ගලයාගෙන් ආමුඛ ප්‍රේෂණ ලෙස ලබන මුදල් වලින්.

(ඇ) මේ යටතේ අවසර දී ඇති කිසියම් ගණුදෙනුවක් සම්බන්ධයෙන් වන ඒකක නිදහස් කිරීමෙන් හෝ අලෙවි කිරීමෙන් ලැබෙන මුදල්, ආදායම් සහ එවැනි වෙනත් ප්‍රතිලාභ ආදී ගෙවීම් ඒ සඳහා බලය පැවරෙන කළමනාකරණ සමාගමක්, භාරකරුවෙකු, බලපත්‍රලාභී වාණිජ බැංකුවක්, බලපත්‍ර ලත් තැරැව්කරුවෙකු හෝ වෙනත් පුද්ගලයෙකු විසින් ආයෝජකයා විසින් විශේෂයෙන්

සඳහන් කරන පරිදි එම ගෙවීම් සුරැකුම්පත් ආයෝජන ගිණුමකට (SIA) ශ්‍රී ලංකාවේ බලපත්‍රලාභී වාණිජ බැංකුවක විවෘත කරන ලද විදේශ මුදල් ඒකකයකින් පවත්වාගෙන යන ඕනෑම ගිණුමකට හෝ ප්‍රතිමුඛ ප්‍රේෂණයක් ලෙස සිදු කළ හැකිය.

(ඇ) කිසියම් ඒකක භාරයක, ඒකක නිකුත් කිරීම හෝ පැවැරුම් හා සම්බන්ධව ඒකක හිමියන් පිළිබඳව නාම ලේඛනයක් පවත්වාගෙන යාමට වගකීම ලද කළමනාකරණ සමාගමක් හෝ වෙනත් පුද්ගලයෙකු විදේශ ආයතනික ආයෝජකයෙකුගේ, ශ්‍රී ලංකාවෙන් පිටත සංස්ථාපිත සමාගමක හෝ ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික පුද්ගලයෙකුගේ නම (ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික ශ්‍රී ලංකිකයන්ද ඇතුළුව) හෝ ඔවුන්ගේ නාමිකයෙකුගේ නම එම ඒකක භාරයේ ඒකක හිමියකු වශයෙන් ලියාපදිංචි කිරීමේදී මෙම දැන්වීමට අදාළ එවැනි නිකුත් කිරීම් හෝ පැවරුම් සම්බන්ධ කොන්දේසිවලට අනුකූලව පිළිගත හැකි සාක්ෂි ඉදිරිපත් කිරීමට අපොහොසත් කිසිවකුගේ නම් ලියාපදිංචි නොකළ යුතු ය.

3. *අර්ථ නිරූපණය* :

(අ) "ඒකක භාරය", "කළමනාකරණ සමාගම", "භාරකරු" සහ "ඒකක හිමියා" සම්බන්ධයෙන් සංශෝධිත 1987 අංක 36 දරන ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභා පනතේ දී ඇති අර්ථයන්ම ඇත්තේ ය.

(ආ) "ශ්‍රී ලංකාවේ නේවාසික පුද්ගලයා" සහ "ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික පුද්ගලයා" සම්බන්ධයෙන් විනිමය පාලන පනත යටතේ 1972.04.21 වැනි දින නිකුත් කරන ලද රජයේ ගැසට් අංක 15007හි දී ඇති අර්ථයන්ම ඇත්තේ ය.

4. 2011.08.18 වැනි දින අංක 1719/22 දරන *අති විශේෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද දැන්වීම මෙයින් පරිච්ඡින්න කරනු ලැබේ.

පී. එච්. ඕ. චන්ද්‍රවංශ,
විනිමය පාලක.

2013 ජනවාරි මස 31 වැනි දින,
කොළඹ දී ය.

02-524

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*